# රුවන්වැලියේ වගතුග

සිංහලයන් වෙනත් කිසිම රටක දක්නට ඇත්නම් ඔවුහු ලංකාවෙන් එහි ගිය අය වෙති. ඒ හැරෙන්නට ඉන්දියාවේ හෝ වෙනත් කිසිම රටක හෝ ආදියෙහි සිට ජීවත්වන සිංහලයන් දක්නට නැත. එහෙත් දෙමළ ජනයා ලංකාවට පැමිණීමට පෙර ඉන්දියාවේ විසූහ. එමෙන් ම සිංහලයෝ ඉංගිරිසින් හෝ වෙනත් යුරෝපීය ජාතියක් හෝ මෙන් නො වෙති. අද ඇමරිකාවේ, කැනඩාවේ, ඕස්ට්‍රේලියාවේ, නවසීලන්තයේ ජීවත්වන සුදු ජාතිකයෝ ඒ රටවලට පැමිණීමට පෙරම ඉංගිරිසි, ප්‍රංශ ආදී ලෙස ජනවර්ග නමින් ම හඳුන්වනු ලැබූහ. ඔවුන් ගිය රටවල එවකටත් සිටි වැසියෝ ආදිවාසීහු (aborigines) වෙති. මෑතක් වන තුරුම එසේ සංක්‍රමණය වුවන් හා ආදිවාසීන් අතර සඳහන්කළ හැකි මිශ්‍රණයක් නො වී ය.

සිංහලයන් මෙරටට දඹදිවින් පැමිණියේ නැත යන්න සිංහලයන් සවිඥානික ව දැනගැනීම අනිවාර්ය වෙයි. එහෙත් අවාසනාවකට බොහෝ සිංහලයන් සිතන්නේ තමන් ඉන්දියාවෙන් පැමිණි බව ය. විජය කුමරු හා ඔහු සමග පැමිණි හත්සියයෙන් සිංහල ජාතිය ඇරඹිණි යැයි බොහෝ දෙනා විශ්වාස කරති. එහෙත් වත්මන් ඉන්දියාවේ හෝ පැරණි භාරතයේ හෝ දඹදිව හෝ සිංහල නමින් ජනවර්ගයක් තිබූ බවට සාක්ෂි නොමැත. සිංහල ජාතිය මෙරට ම බිහි වී ඇති බව පැහැදිලි ය. එහෙත් එයින් කියැවෙන්නේ සිංහල ජාතිය හෝ සිංහල ජනවර්ගය හෝ අවුරුදු විසිපන්දාහක් හෝ එයටත් වඩා හෝ පැරණි බව නො වෙයි. ඇතැමුන් එසේ කිව ද ඒ සඳහා සාක්ෂි නැත. එවැනි වූ අතීතයක ද මෙරට මිනිසුන් වාසය කර ඇති බවට සාක්ෂි තිබුණ ද, ඒ සිංහලයන් යැයි කීමට නො හැකි ය.

සිංහල ජාතිය බිහි වී ඇත්තේ දඹදිව නැගෙනහිර වෙරළින් සංක්‍රමණය වූ අර්ධ වෛදිකයන්, එහි බටහිර වෙරළින් පැමිණි සුළු පිරිසක්, මෙරට ඈත අතීතයේ සිට ජීවත් වූ යක්ෂ නාග දේව ආදී ගෝත්‍ර සමග සම්මිශ්‍රණයෙන් යැයි සිතිය හැකි ය. සිංහල ජාතිය ගොඩනැගී ඇත්තේ මෙරට විසූ ගෝත්‍රිකයන්ගේ ද මිශ්‍රණයෙන් බැවින් සිංහලයන්ගෙන් බාහිර වූ වෙන ම ආදිවාසීහු  මෙරට නො වූහ. එබැවින් සිංහලයන්ට සාපේක්ෂව වැද්දන් ආදිවාසීන් ලෙස ගැනීම සංකල්පීය වශයෙන් නිවැරදි නො වෙයි. මෙරට ආදී වාසීන් යනුවෙන් කොටසක් වෙන්කළ හැක්කේ අවශ්‍ය නම් මුස්ලිම් ජනයාට හා දෙමළ ජනයාට සාපේක්ෂව ය. ඔවුන්ට සාපේක්ෂව සිංහලයෝ ද වැද්දෝ ද ආදිවාසීහු වෙති.

අප සංකල්ප භාවිතයේ දී සුපරීක්ෂාකාරී විය යුතු ය. බටහිරයෝ තම රටවල් සම්බන්ධ ප්‍රපංචවල දී සුපරීක්ෂාරී ලෙස සංකල්ප යොදාගත්ත ද අපේ රටවල් සම්බන්ධයෙන් එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය නො කරති. ඒ තම වාසියට හා තමන්ට අවශ්‍ය දේ කීමට ය. ලංකාවේ දී ඔවුන්ට අවශ්‍ය සිංහලයන්ට හිමි තැන ලබා නො දීම ය. ඒ සඳහා සිංහලයන් ද, දෙමළ හා අනෙක් ජනවර්ග ද සමාන තත්වයෙහි ලා සැලකෙන සංකල්ප හා ප්‍රවාද ඔවුන්ට අවශ්‍ය වෙයි. වැද්දන් ආදිවාසීන් ලෙස ගත්කල සිංහල දෙමළ මුස්ලිම් ආදී සියල්ලෝ ම පිටින් පැමිණි අය වෙති.

සිංහලයන් තමන් පිටින් පැමිණි පිරිසක් ලෙස සිතන තාක් බටහිරයන් වැදි ජනතාව වෙත පමණක් පටවන ආදිවාසී සංකල්පයෙන් නිදහස් විය හැකි නො වෙයි. සිංහලයන් පැමිණියේ යැයි කියන දඹදිව කාලිංග (ඔරිස්සා) වංග (බෙංගාල) හෝ බටහිර වෙරළේ ප්‍රදේශවලට ගිය ද සිංහලයන් සොයා ගැනීමට නො හැකි ය. සිංහලයන් එලෙස වෙනත් රටක ජීවත් නොවුණ ද, දෙමළ ජනයා දකුණු ඉන්දියාවෙන් ද, මුස්ලිමුන් ද බහුතරය දකුණු ඉන්දියාවෙන් ද සංක්‍රමණය වී ඇති බව පැහැදිලි ය. මෙරට මුස්ලිම් ජනයා අරාබි නොව දෙමළ කතාකිරීමට ප්‍රධාන හේතුව ඔවුන් දකුණු ඉන්දියාවේ දෙමළ කතාකරන ප්‍රදේශවලින් පැමිණි අය වීම ය.

ආදිවාසි යන සංකල්පය ජනවර්ගයක් හැඳින්වීම සඳහා යෙදිය හැක්කේ වෙනත් ජනවර්ගයකට හෝ ජාතියකට හෝ සාපේක්ෂව ය. ඕස්ට්‍රේලියාවට ඉංගිරිසින් නොගියේ නම් හා එහි එදා සිටි ජනවර්ගය කිසිදු බාහිර බලපෑමකට හසු නොවී දිගින් දිගට ම ජීවත් වී නම් ඔවුන් ආදිවාසී  යනුවෙන් හැඳින්වීම අනවශ්‍ය වෙයි. එහි දී ඒ ජනවර්ගය ඕස්ට්‍රේලියාවට පිටින් පැමිණියේ ද නැද්ද යන්නවත් අදාළ නො වෙයි. ඔවුන් ආදිවාසීන් වූයේ ඕස්ට්‍රේලියාවට පසුව පැමිණි ඉංගිරිසින්ට සාපේක්ෂව ය. නවසීලන්තයේ ද ඇමරිකාවේ ද තත්වය එසේ ම විය.

© Prof. Nalin De Silva

දඹදිවින් අර්ධ වෛදිකයන් නැගෙනහිරින් හා වෙනත් සුළු පිරිසක් බටහිරින් ලංකාවට සංක්‍රමණය වන විට මෙරට තත්වය එසේ නො වී ය. අවුරුදු දහස් ගණනක් තිස්සේ විවිධ ගෝත්‍ර මෙරට වාසය කර තිබුණි. දඹදිවින් පැමිණි පිරිස ඉංගිරිසින් මෙන් ජනවර්ගයකට හෝ ජාතියකට හෝ අයත් නොවූහ. ඔවුන් මෙහි පැමිණි දින සිට ම මෙන් මෙරට සිටි ගෝත්‍රිකයන් සමග යුද්ධවලට ද ආවාහ විවාහ කටයුතුවලට ද සහභාගි වූහ. ඒ සියල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස සියවස් පහක හයක ඇවෑමෙන් සිංහල ජාතිය නමින් නව ජාතියක් මේ භූමියේ ම ඇතිවිය. සිංහල ජාතිය බිහිවීමට දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන් දායක වූ බව සැබෑ ය. එහෙත් එහි දී දායක වූයේ ඔවුන් පමණක් නො වෙයි. මෙරට සිටි විවිධ ගෝත්‍ර ද එයට දායක විය. එසේ නම් ඒ කිසිම ගෝත්‍රයකට  සාපේක්ෂව තවත් එක් ගෝත්‍රයක් පමණක් ආදිවාසී විය නො හැකි ය. සිංහල ජාතිය ගොඩනැගීමට දායක වූ ගෝත්‍ර පසෙක ලා ඒ ගෝත්‍රවල දායකත්වයෙන් බිහිවූ සිංහල ජාතියට සාපේක්ෂව එකල සිටි එක් ගෝත්‍රයක් පමණක් වූ වැදි ජනයා ආදිවාසින් ලෙස හැඳින්වීම හිසිසේත් ම සංකල්පීය වශයෙන් ගත්කල නිවැරදි නො වෙයි.

සිංහල ජාතියේ සම්භවය හා ඉතිහාසය දැනගැනීමේ දී  අප අනුගමනය කරන්නේ එකම එක විධි ක්‍රමයකි. එයට විධි ක්‍රමයක් යැයි කීම පවා උචිත නො වෙයි. එයට ක්‍රියා පටිපාටියක් යැයි කීම නිවැරදි විය හැකි ය. ඒ හැඳින්වීම සඳහා යොදාගත හැකි නම කුමක් වුවත් ඉතිහාසයේ පමණක් නොව භෞතික විද්‍යාවේ ද අප අනුගමනය කරන්නේ ඒ පටිපාටිය ය. එහි දී අපි හැකි අවස්ථාවල දී පරීක්ෂණ (අත්හදා බැලීම්  ඉතිහාසය තාරකා භෞතිකය වැනි විෂයයන්හි අත්හදා බැලීම් කළ නො හැකි ය), නිරීක්ෂණ, සාධක, සංකල්ප, ප්‍රවාද ආදී සියල්ල සලකා සමස්තයක් ලෙස ගත්කල නිර්මාණය කළ හැකි හැකිතාක් සංගත නව ප්‍රවාදය කුමක් දැයි සොයා බලමු. සිංහල බෞද්ධ ඥාන විභාගයට අනුව අපි තහි දී අනුමානය (inference) හා ප්‍රත්‍යක්ෂය යොදා ගනිමු. අවශ්‍ය අවස්ථාවල දී ඇරිස්ටෝටලීය න්‍යායට කොටු නොවී වෙනත් න්‍යාය ද අනුගමනය කරමු.

ඉතිහාසයෙහි දී සාධක වනුයේ සෙල් ලිපි, පුරා වස්තු, ඓතිහාසික ගොඩනැගිලි හා කර්මාන්ත, සාහිත්‍යය, ජනප්‍රවාද ආදිය ය. මෙහි දී  සඳහන් කළයුතු වැදගත් කරුණ නම් සාධක ප්‍රවාදවලින් ස්වායත්ත (නිදහස්) නොවන බව ය. සාධක යනු අප විසින් ඊනියා විවෘත මනසකින් ග්‍රහණය කරගනු ලබන දේ නො වෙයි. සෑම සාධකයක් පසුපස ම ප්‍රවාදයක් හෝ අඩුම තරමින් සංකල්පයක් වෙයි. රුවන්වැලි සෑය අප එලෙස දකින්නේ ඇයි? අපි එය සෑයක් ලෙස හඳුනාගනිමු. සෑයක බුදුන්වහන්සේගේ ධාතුන්වහන්සේ නිදන් කර ඇති බව අපි දනිමු. රුවන්වැලි සෑය තනවනු ලැබ ඇත්තේ ගැමුණු රජතුමා විසින් බව අපි දනිමු.

යම්කිසි අයුරකින් වෙනත් රජ කෙනකු රුවන්වැලි සෑය ගොඩනගා ඇත්නම් අපට ඒ බව තේරුම්ගැනීමට කොපමණ කල්යාවි ද? ඒ සඳහා අපට අළුත් ම සාධක අවශ්‍ය වනු ඇත. එහෙත් ඒ අළුත් සාධක, එලෙස සාධක ලෙස අපට පෙනෙන්නට පටන්ගනු ඇත්තේ අප රුවන්වැලි සෑයේ නිර්මාපකයා ගැමුණු රජතුමා නොවේ යැයි පිළිගැනීමට සූදානම් නම් පමණකි. එසේ නැත්නම් අපට ඒ අළුත් සාධක, සාධක නොවනු ඇත. සාධක නිසා අළුත් ප්‍රවාදයක් ඇතිවනවා නොව සාධක සාධක බවට පත්වන්නේ ම ප්‍රවාදයක් ඇසුරු කරගෙන ය.

රුවන්වැලි සෑයේ නිර්මාපකයා කවුද යන ප්‍රශ්නය පසෙකට ලා අප මහාසෑයට සිංහලෙන් රුවන්වැලි කියන්නේත් පාළියෙන් ස්වර්ණමාලි කියන්නේත් ඇයි ද යන්න සොයා බලමු. බැලූ බැල්මට මෙහි පරස්පරයක් ඇත. මාලි යන්න වැලි වූයේ කෙසේ ද යන්න ඇතැමුනට ප්‍රශ්නයකි. එබැවින් ඇතැම්හු මහාසෑය රුවන්මැලි සෑය යනුවෙන් හඳුන්වති. එහෙත් සිංහලෙන් රුවන්මැලි යැයි කී විට එහි අරුතක් නැති වෙයි. රුවන්වැලි යන්නෙහි අරුත කුමක් දැයි දැන් කිසිවකුට ප්‍රශ්නයක් වනු ඇත. එහෙත් මේ සියළු ප්‍රශ්න රුවන්වැලි සෑය පිළිබඳ ව ජනප්‍රවාදයෙහි හා සාහිත්‍යයෙහි ඇති තොරතුරු ඔස්සේ බැලූ විට විසඳෙයි.

ගැමුණු රජතුමා මහාසෑය කරවීමට පෙර එතැන තිබී ඇත්තේ ගාඩි කුලය යැයි හැඳින්වෙන්නන්ගේ දේවාලයකි (පූජනීය ස්ථානයකි). ඒ දේවාලය ස්වර්ණමාලි දෙවඟනගේ නමින් කරවී යැයි සඳහන් වෙයි. එහෙත් මේ දෙවඟන යනු අදාළ කුලයේ පැරැන්නියක බව පැහැදිලි ය. ඒ කුලයේ කාන්තාවන් ඇතැම්විට නම් කෙරෙන්නේ වල්ලි කියා ය. එබැවින් මේ දෙවඟනගේ නම රත්නවල්ලි වී යැයි සිතිය හැකි ය. ගැමුණු රජු දේවාලය තිබූ තැන සෑයක් කරවීමෙහි දී අදාළ කුලයෙන් එයට යම් විරෝධයක් මතුවන්නට ඇත. වැදි ජනවර්ගය මෙන් ම මේ කුලය ද සිංහල ජාතියෙන් පිටත

© Prof. Nalin De Silva

තිබී ඇත. බෞද්ධ නොවූ ඒ කුලයෙන් එවැනි විරෝධතාවක් බලාපොරොත්තු විය යුතු ව තිබුණි. මේ විරෝධතාවට ද ඉතිහාසයක් සිබු බව ඉතිහාසයෙන් ම පෙනී යයි.

වංශකතාවලට අනුව එතැන සෑයක් කරවීමට පළමුවෙන් ම අවශ්‍ය වී ඇත්තේ දේවානම්පිය තිස්ස රජුට ය. එහෙත් මිහිඳු හිමියන් එසේ කිරීමෙන් එතුමා වළකා ඇත. උන්වහන්සේ එසේ වැළැක්වූයේ ඇයි? වංශකතාවලට අනුව මිහිඳු හිමියන් රජුට පවසා ඇත්තේ මතු දවසක එතුමන්ගේ මුණුබුරකු එතැන සෑයක් ඉදිකිරීමට නියමිත බැවින් සෑය කරවීමට මුණුබුරාට ම ඉඩ තබන ලෙස ය. මිහිඳු හිමියන් දිවැසින් බලා රජු සැනසීමට ඒ බව පවසන්නට ඇත, එහෙත් මේ කතාවෙහි තවත් පැත්තක් වෙයි. එදා දේවානම්පිය තිස්ස රජුට ගාඩි කුලයේ ජනයාගේ තදබල විරෝධය හමුවේ එතැන සෑයක් කරවීමට නො හැකිවිය යනු මේ කතාවේ හරය විය නො හැකි ද?

දේවානම්පිය තිස්ස සමය වන විට සිංහල ජාතිය ඇති වී සුළු කලකි. එවකටත් ඇතැම් යක්‍ෂ ගෝත්‍රිකයෝ සිංහලයන්ට විරුද්ධ වූහ. ඒ විරෝධතාවත් සමග ඔවුන් රජුගේ අධිකාරය නොපිළිගත් බව පැහැදිලි ය. මිහිඳු හිමියන් මිස්සක පව්ව මුදුනේ සිට රජුට තිස්ස යැයි ආමන්ත්‍රණය කළවිට රජතුමා ඒ යකකු දැයි බිය වූ බව වංශකතාවෙන් හෙළි වෙයි. ඉන් කියැවෙන්නේ රාජ්‍ය අධිකාරය නොපිළිගත් යක්‍ෂයන් පිරිසක් එකල සිටි බවත් ඔවුන් රජතුමාට නමින් ම ආමන්ත්‍රණය කළ බවත් රජතුමා ඔවුන් කෙරෙහි බියෙන් පසු වූ බවත් ය. සිංහල ජාතිය ඇති වී වැඩිකල් නොගිය සමයක සිංහලයන් බෞද්ධයන් වූ විගස සිංහල ජාතියෙන් පිටත සිටි කුලයක ආගමික සිද්ධස්ථානයක් තිබූ තැනක සෑයක් කරවීමට තරම් ශක්තියක් දේවානම්පිය තිස්ස රජුට නොවූ බව පැහැදිලි ය. සිංහල රජකුට ඒ ශක්තිය ලැබුණේ ගැමුණු සමයෙහි දී ය. එහෙත් එහිදී ද කොන්දේසියක් පැණවීමට ගාඩි කුලයේ ප්‍රධානීන් සමත් වී ඇත. ඒ කොන්දේසියට අනුව රත්නවල්ලි දෙවඟනගේ නමින් සෑය බැඳිය යුතු විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva